# ECONOMIC GROWTH
# &
# DEVELOPMENT
# (Part-VIII)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# ශ්‍රම බලකාය

යම් නිශ්චිත කාල සීමාවක් තුළ වැටුපක් හෝ වෙනත් ආර්ථික ප්‍රතිලාභයක් හෝ අපේක්ෂාවෙන් ආර්ථික වටිනාකමක් ඇති භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රමය සපයන සහ සැපයීමට අපේක්ෂා කරන අවම හා උපරිම වයස් සීමාවන් තුළ සිටින සියලුම පුද්ගලයන්ගේ එකතුව ශ්‍රම බලකාය යනුවෙන් හැඳින්වේ.

වඩාත් සරලව පවසන්නේ නම් ශ්‍රම බලකාය යනු කිසියම් රටක කිසියම් කාලයක් තුළ (සලකා බලන කාලය තුළ) සේවා නියුක්තව සහ සේවා වියුක්තව සිටින දෙපිරිසෙහි එකතුවයි.

ClassWork.LK

## ශ්‍රම බලකාය ගණනය කිරීම

ශ්‍රම බලකාය ගණනය කිරීමේදී ලෝකයේ විවිධ රටවල් විවිධ වයස් සීමාවන් යොදා ගනියි.

ශ්‍රී ලංකාවේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව ශ්‍රම බලකාය ගණනය කරන ආකාරය පහත දැක්වේ.

| | |
|---|---|
| **මුළු ජනගහනයෙන් වයස අවු. 15 හා ඊට වැඩි සියලු දෙනා** | **xxx** |
| **අඩු කළා : ගෘහණියන්** | **(xxx)** |
| **පූර්ණ කාලීන සිසුන්** | **(xxx)** |
| **පූර්ණ ආබාධිතයන්** | **(xxx)** |
| **ස්ව කැමැත්තෙන් රැකියා නොකරන අය** | **(xxx)** |
| **ශ්‍රම බලකාය (වයස අවු. 15 හා ඊට වැඩි සක්‍රිය ජනගහනය)** | **xxx** |

ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් වයස අවුරුදු 15 හා ඊට වැඩි ජන සංඛ්‍යාව වැඩ කළ හැකි වයසේ ජනගහනය ලෙස හැඳින්වෙන අතර එම වයස් පරාසය තුළ සිටින ජන සංඛ්‍යාවෙන් ගෘහණියන්, පූර්ණ කාලීන ශිෂ්‍යයන්, විශ්‍රාමිකයන්, මහළු අය, බෙලහීන හෝ ආබාධිත අය හෝ, ස්ව කැමැත්තෙන් සේවා වියුක්ත වූවන් අඩු කළ විට ඉතිරි වන ජන සංඛ්‍යාව ශ්‍රම බලකාය යනුවෙන් හැඳින්වේ.

ClassWork.LK

# ශ්‍රම බලකාය සහභාගිත්ව අනුපාතය

ශ්‍රම බලකාය, වැඩ කළ හැකි වයසේ ජන සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම ශ්‍රම බලකාය සහභාගිත්ව අනුපාතය ලෙස හැඳින්වේ.

$$\text{ශ්‍රම බලකාය සහභාගිත්ව අනුපාතය} = \frac{\text{ශ්‍රම බලකාය}}{\text{වැඩ කළ හැකි වයසේ ජනගහනය}} \times 100$$

ClassWork.LK

## ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ මෑත කාලීන ව දැකිය හැකි ලක්ෂණ

ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ මෑත කාලීන ව දැකිය හැකි ලක්ෂණ කීපයක් පහත දැක්වේ.

- වැඩ කළ හැකි වයසේ ජනගහනය අඩු වීම
- ශ්‍රම බලකාය සහභාගිත්ව අනුපාතය ඉහළ යාම
- කාන්තාවන්ගේ ශ්‍රම සහභාගිත්ව අනුපාතය ඉහළ යාම
- කාන්තාවන්ට සාපේක්ෂ ව පිරිමි ශ්‍රම සහභාගිත්ව අනුපාතය ඉහළ අගයක් ගැනීම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura